# හඬෙහි විවිධ පරාස මතුවන සේ සංවාද භාවිතය

නාට්‍යක දී අදහස් ප්‍රකාශනයේ ප්‍රබලම මාධ්‍ය වන්නේ කටහඬයි. එහි දී වාචික අභිනය ප්‍රබල වේ. එනිසා රංගන ශිල්පියෙක් ලෙස ඒ පිළිබඳ හොඳ දැනුමකින් හා අවබෝධයකින් යුක්ත විය යුතුය. සාර්ථක ලෙස තම කටහඬ භාවිත කරමින් හැඟීම් ප්‍රකාශ කිරීමට නම් කටහඬ හා ශ්වසන අභ්‍යාසවල ද නිරත විය යුතුය. මෙම අභ්‍යාස රංග අභ්‍යාස නම් වේ.

අප ජීවත් වන වට පිටාවේ මිනිසුන්ගේ හා සතුන් ගේ විවිධ ශබ්ද අපට ඇසේ. මිනිසා තමන් උපදවන ශබ්ද වලට අර්ථයක් ලබා දේ. සතුන් ගේ හඬට වඩා මිනිසා ගේ හඬ විවිධ පරාස කරා ගමන් කරයි. උස් පහත් හා මධ්‍යස්ථ ලෙස හඬ පවතී. පුද්ගලයාගෙන් පුද්ගලයාට, මානසික ස්වරූප මත, අවස්ථාව අනුව, ජීවත් වන පරිසරය අනුව හඬ වෙනස් වේ. ඒ ආකාරයටම රංගන ශිල්පියෙකුට මෙම හඬ භාවිතය පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.

නාට්‍යක පිටපතේ ඇති සංවාද, ගීත ආදිය හැසිරවීමට අපට හඬ භාවිතය වැදගත් වේ. ඒ සඳහා අප සමාජයේ දක්නට ලැබෙන විවිධ චරිත නිරීක්ෂණය කල යුතුය. ඔවුන් එකිනෙකාට වෙනස් ලෙස හඬ භාවිත කරයි.

- හාමුදුරුනමක ගේ කතාව
- මාළු වෙළෙන්දෙකු ගේ කතාව
- හිගන්නෙකුගේ කතාව

මෙවැනි චරිත පිළිබඳ හොඳ අවධානයකින් සිටීම රංගන ශිල්පියෙක් ලෙස එවැනි චරිතයක් ලැබුන විට සාර්ථකව නිරූපණය කිරීමට හැකි වේ.

පිටපතක සංවාද භාවිතයේ දී එම මොහොතේ සිටින හැඟීම අනුව සංවාද උච්චාරනය කළ යුතුය. දුක, සතුට, ආදරය, කරුණාව, තරහා නිරූපණය කරන විට චරිතයට අදාළ වන පරිදි සංවාද උච්චාරණය කළ යුතුය. එක තලයක නොපිහිටා කටහඬ උස් පහත් කිරීම මගින් හැඟීම් පාලනය කරමින් කටහඬ හසුරුවා ගත හැකිය.

පැවරුම් :

ශ්‍රවන් විදුලි නාට්‍ය කිහිපයක් ලියන්න. ශ්‍රවනය කරන්න.

විවිධ අවස්ථාවන්ට උචිත, විවිධ හැඟීම් දනවන සංවාද ඛණ්ඩ කිහිපයක් ලියන්න.

විවිධ හඬ පරාස ඇති සතුන්ගේ නම් ලැයිස්තුවක් ලියන්න.